# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2011 අංක 36 දරන ලෙස්ටර් ජේම්ස් පීරිස් සහ සුමිත්‍රා පීරිස් පදනම (සංස්ථාගත කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 2011 අගෝස්තු මස 23 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2011 අගෝස්තු මස 26 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

**මිළ : රු. 5.25 යි.** **තැපැල් ගාස්තුව : රු. 10.00 යි.**

**2011 අංක 36 දරන ලෙස්ටර් ජේම්ස් පීරිස් සහ සුමිත්‍රා පීරිස් පදනම (සංස්ථාගත කිරීමේ) පනත**

[සහතිකය සටහන් කළේ 2011 අගෝස්තු මස 23 වැනි දින]

එල්.ඩී.—ඕ. අයි.එන්.සී 6/2011.

**ලෙස්ටර් ජේම්ස් පීරිස් සහ සුමිත්‍රා පීරිස් පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

පූර්විකාව.

"ලෙස්ටර් ජේම්ස් පීරිස් සහ සුමිත්‍රා පීරිස් පදනම" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන පදනමක්, එකී සාමාජිකයන් එකඟ වූ රීති අනුව, එහි පරමාර්ථ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ ඊට අදාළ කාරණා ඵලදායි ලෙස කරගෙන යාමේ කාර්යය සඳහා ශ්‍රී ලංකාවේ මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද:

එකී පදනම පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කාරණා සඳහා ද, ඒ පරමාර්ථ සහ කාරණා මෙතෙක් කල් එකී පදනම විසින් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් ද, එකී පදනම සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති බැවින් ද, ඒ ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2011 අංක 36 දරන ලෙස්ටර් ජේම්ස් පීරිස් සහ සුමිත්‍රා පීරිස් පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ලෙස්ටර් ජේම්ස් පීරිස් සහ සුමිත්‍රා පීරිස් පදනම සංස්ථාගත කිරීම.

**2.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසුව (මෙහි මින් මතු "පදනම" යනුවෙන් සඳහන් කරනු ලබන) ලෙස්ටර් ජේම්ස් පීරිස් සහ සුමිත්‍රා පීරිස් පදනමෙහි දැනට සාමාජිකයන් වශයෙන් සිටින තාක් තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු සාමාජිකයන් වශයෙන් බඳවා ගනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "ලෙස්ටර් ජේම්ස් පීරිස් සහ සුමිත්‍රා පීරිස් පදනම" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතුය. තව ද, එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, එයට විරුද්ධව ද, නඩු පවරනු ලැබිය හැකි ය. තව ද, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද, පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද, පූර්ණ බලය සහ අධිකාරය ඊට ඇත්තේ ය.

2—PL005427—2,590(2011/01)

සංස්ථාවේ පොදු පරමාර්ථ.

**3.** (1) මණ්ඩලය සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද ඒ පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) ශ්‍රී ලංකා සිනමාව හා ඒ හා ආශ්‍රිත පුද්ගලයන් සංවර්ධනය කිරීම, ප්‍රවර්ධනය කිරීම හා චිරස්ථිතිය ඇති කිරීම සඳහා ආධාර සැපයීම;

(ආ) ළමයින් හා වැඩිහිටි තරුණයන් සඳහා සිනමාව හා ඒ හා සම්බන්ධ කලාවන් සහ ශිල්ප ප්‍රවර්ධනය කිරීම හා පෝෂණය කිරීම;

(ඇ) අධ්‍යාපනික, විද්‍යා, සංස්කෘතික, සාහිත්‍ය, කලා, ශාරීරික දක්ෂතාවයන් හා යෝග්‍යතාවයන් ප්‍රවර්ධනය කිරීම, වැඩිදියුණු කිරීම, සංවර්ධනය කිරීම, ඒ සඳහා මුදලින් ආධාර කිරීම හා පවත්වාගෙන යාම;

(ඈ) මානුෂික කල්පිතයන්, ප්‍රජාතාන්ත්‍රික හා අනේකත්ව සාරධර්ම, යහපත් පුරවැසිභාවය, ජාතිහිතෙෂී අදහස් හා විශ්වාසයන් ප්‍රවර්ධනය කිරීම, ප්‍රචාරණය හා පෝෂණය කිරීම;

(ඉ) ව්‍යවසායකත්වයේ දක්ෂතාවයන් හා හැකියාවන්, ව්‍යාපාර සඳහා පර්යේෂණ හා පුහුණුව, තාක්ෂණය හා කළමනාකරණය සහ ආදායම් උපදවන හා ස්වයං රැකියා ව්‍යාපාර හා ව්‍යවසාය සංකල්පය වැඩිදියුණු කිරීම, සංවර්ධනය කිරීම, ඇති කිරීම, ප්‍රවර්ධනය කිරීම හා පවත්වාගෙන යාම;

(ඊ) විද්‍යා, සංස්කෘතික, අධ්‍යාපනික, ආර්ථික හා මනුෂ්‍ය සංවර්ධනයේ අනෙකුත් අංශවල පර්යේෂණ හා පර්යේෂණ පහසුකම් පිහිටුවීම, වැඩිදියුණු කිරීම, දිරිමත් කිරීම, සංවර්ධනය කිරීම හා පවත්වාගෙන යාම;

(උ) පදනමේ අරමුණු වැඩිදියුණු කිරීමේ දී අවශ්‍ය වන කාරණා සම්බන්ධයෙන් රජයට, රාජ්‍ය නොවන සංවිධාන හා පුද්ගලයන්ට උපදෙස් දීම හා සහාය වීම;

(ඌ) මුද්‍රිත, විද්‍යුත් හෝ වෙනත් යම් මාධ්‍යයන් මගින් පවත්වාගෙන යනු ලබන ලෙස්ටර් ජේම්ස් පීරිස් මහතා සහ සුමිත්‍රා පීරිස් මහත්මිය විසින් කරන ලද මුල් පිටපත්, අත් පිටපත්, පොත්, ලියුම්, ලිපි, කාව්‍ය, ඡායාරූප, ඇතුළු

ඒ මහතා සහ මහත්මිය විසින් නිර්මාණය කරන ලද සිනමා රූපසටහන් හා වෙනත් නිර්මාණ ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීම ;

(එ) ලෙස්ටර් ජේම්ස් පීරිස් මහතා සහ සුමිත්‍රා පීරිස් මහත්මියට හිමි හා ඔවුන් විසින් භාවිතා කරන ලද සිනමා උපකරණ හා පෞද්ගලික සිහිවටන ආරක්ෂා කිරීම;

(ඒ) ශ්‍රී ලංකා චිත්‍රපට සාදන්නන්ගේ සිනමා රූපසටහන් සහ වෙනත් නිර්මාණ ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීම සඳහා ලේඛනාරක්ෂක පවත්වාගෙන යාම;

(ඔ) පොදු හෝ විශේෂිත ක්ෂේත්‍රයක නිර්මාණ කුසලතා වර්ධනය කිරීම හා ඒවාට දිරිදීම සඳහා තෑගි, ප්‍රදාන හා සම්මාන හෝ ශිෂ්‍යත්ව ලබා දීම;

(ඕ) මෙහි සඳහන් පරමාර්ථ ඉදිරියට කරගෙන යෑම සඳහා විශේෂයෙන්ම සෑම අංශයකම, අධ්‍යාපන කටයුතු සඳහා සම්මන්ත්‍රණ, රැස්වීම්, වැඩමුළු, සාකච්ඡා, කථා, පන්ති, චිත්‍රපට, චිත්‍රපට ප්‍රදර්ශන, නිරූපණය කිරීම්, ක්‍රීඩා හා විනෝදාත්මක ක්‍රියාකාරකම් සංවිධානය කිරීම, පැවැත්වීම හා ඒවාට සහභාගිවීම හා පොත් පත්, වාර සඟරා, සඟරා, ලිපි හා ප්‍රවෘත්ති පත්‍ර ලිවීම, මුද්‍රණය කිරීම සහ පළ කිරීම;

(ක) සංස්ථාවේ මූලික පරමාර්ථ සැලකිල්ලට ගෙන පුස්තකාල, වැඩමුළු හා කියවීම් ශාලා පිහිටුවීම හා පවත්වාගෙන යාම හා ඒවාට අවශ්‍ය උපකරණ සැපයීම ;

(ග) සංස්ථාවේ අරමුණු සඳහා අවශ්‍ය යැයි තහවුරු විය හැකි ලිපි, වාර සඟරා හා අනෙකුත් පොත්පත් හා තොරතුරු පළ කිරීම; සහ

(ච) භාරගැනීම අභිප්‍රේත වන්නා වූ යම් භාරයක් ගෙවීමකින් තොරව හෝ අන්‍යාකාරයකින් භාරගැනීම සහ ක්‍රියාත්මක කිරීම.

**(2)** මේ වගන්තියේ (1) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් කොට ඇති පරමාර්ථ ක්‍රියාවට නැංවීමේ දී වර්ගය, ආගම, භාෂාව, කුලය, ස්ත්‍රී පුරුෂ භාවය, දේශපාලන මතය හෝ උපන් ස්ථානය පිළිබඳ වෙනස්කම්වලින් තොරව හැකි පහසු පමණින් ඒවා ක්‍රියාත්මක කිරීමට මණ්ඩලය සහතික විය යුතු ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**4.** (1) සංස්ථාවේ කටයුතු 6 වන වගන්තිය යටතේ සාදනු ලබන සංස්ථාවේ රීතිවලට අනුකූලව තෝරා පත් කර ගනු ලබන හෝ පත් කර ගනු ලබන සභාපති, ලේකම්, සහ වෙනත් ධූර දරන්නන්ගෙන් සමන්විත, (මේ පනතේ "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) අධ්‍යක්ෂ මණ්ඩලයක් විසින්, 6 වන වගන්තිය යටතේ සාදනු ලබන රීති වලට සහ මේ පනතේ අනෙකුත් විධිවිධානවලට යටත්ව, පරිපාලනය කරනු ලැබිය යුතු ය.

(2) ප්‍රථම මණ්ඩලය මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනට පෙරාතුව ම වූ දිනයේ දී පදනමේ පරිපාලක මණ්ඩලයේ ධූර දරමින් සිටි සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

**5.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන වලට යටත්ව සංස්ථාවේ පරමාර්ථ හෝ ඉන් එක් පරමාර්ථයක් වැඩිදියුණු කිරීම හෝ සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය හෝ අපේක්ෂිත සියලු ක්‍රියා, කාරණා සහ දේ කිරීම, ඉටුකිරීම හා ක්‍රියාත්මක කිරීම ඇතුලු පහත දැක්වෙන දෑ කිරීමේ බලය සංස්ථාවට ඇත්තේ ය:—

(අ) සංස්ථාවේ කාර්ය සඳහා අවශ්‍ය වන යම් නිශ්චල දේපළක් අත්කර ගැනීම, දැරීම, බද්දට හෝ කුලියට ගැනීම හෝ දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිණීම, හුවමාරු කිරීම හෝ වෙනත් යම් ආකාරයකින් නියාදනය කිරීම, බැඳීමකට යටත් කිරීම හෝ බැහැර කිරීම;

(ආ) සංස්ථාවේ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා හෝ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන සියලු ගිවිසුම් වලට හෝ කොන්ත්‍රාත්තුවලට කෙලින්ම හෝ සංස්ථාව විසින් බලය පවරනු ලැබූ සංස්ථාවේ යම් නිලධරයකු හෝ අනුයෝජිතයකු මාර්ගයෙන් ඇතුළත් වීම, ඒවා ඉටු කිරීම හෝ ක්‍රියාත්මක කිරීම;

(ඇ) මුදලින් හෝ ද්‍රව්‍ය වලින් ප්‍රදාන, ත්‍යාග, පරිත්‍යාග හෝ රික්තවරණ භාර ගැනීම:

එසේ වුව ද, මේ පනතේ වෙනත් යම් විධිවිධානවල පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, සියලුම විදේශීය ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග සම්බන්ධයෙන් මණ්ඩලය විසින්, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ

විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ පූර්ව ලිඛිත අනුමතය ලබාගත යුතු ය. එවැනි ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග සම්බන්ධයෙන් වූ සංස්ථාවේ ගිණුම් විගණකාධිපතිවරයා විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

(ඇ) ස්වකීය අරමුදල් ආයෝජනය කිරීම සහ යම් බැංකුවක ජංගම, තැන්පතු සහ ඉතිරි කිරීමේ ගිණුම් ආරම්භ කිරීම, පවත්වාගෙන යාම සහ වසා දැමීම;

(ඉ) සංස්ථාවේ කාර්ය සඳහා අවශ්‍ය වන මුදල් සුදුසු යයි සංස්ථාව විසින් සඳහන් කරනු ලබන ආකාරයට සහ එසේ සුදුසු යයි සලකනු ලබන ඇප මත ණයට ගැනීම හෝ ආයෝජනය කිරීම; සහ

(ඊ) සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන නිලධරයන් සහ සේවකයන් පත් කිරීම, සේවයෙහි යෙදවීම, මාරු කිරීම, ඔවුන් විෂයයෙහි විනය පාලනය පවත්වා ගෙන යාම.

සංස්ථාවේ රීති.

**6.** (1) සංස්ථාවේ යම් මහා සභා රැස්වීමක දී, ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් පහත දැක්වෙන කාරණා සියල්ලම හෝ ඉන් කිසිවක් හෝ සඳහා මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක හෝ විධිවිධානවලට අනනුකූල නොවන රීති සංස්ථාව විසින් කලින් කල සාදනු ලැබීම නීත්‍යානුකූල වන්නේ ය:—

(අ) සාමාජිකත්වය වර්ග කිරීම සහ සාමාජිකයන් ඇතුලත් කර ගැනීම, ඉල්ලා අස්වීම හෝ නෙරපීම;

(ආ) ධුර දරන්නන් තෝරා පත්කර ගැනීම, ධුර දරන්නන්ගේ ධුරයෙන් ඉල්ලා අස්වීම, ධුරය හිස් කිරීම හෝ ධුරයෙන් ඉවත් කිරීම සහ ඔවුන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය;

(ඇ) සංස්ථාවේ විවිධ නිලධරයන්, අනුයෝජිතයන් සහ සේවකයන්ගේ බලතල, කාර්යය සහ කර්තව්‍ය;

(ඈ) සංස්ථාවේ සහ මණ්ඩලයේ රැස්වීම්වල දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය හෝ සංස්ථාවේ සහ මණ්ඩලයේ රැස්වීම් කැඳවීම සහ පැවැත්වීම, ඒ රැස්වීම් පවත්වන ස්ථාන, වේලාව, ඒ පිළිබඳ දැන්වීම්, න්‍යාය පත්‍රය සහ ගණපූරණය සහ එම රැස්වීම්වල කටයුතු කරගෙන යාම;

(ඉ) සංස්ථාවේ දේපළ පරිපාලනය සහ කළමනාකරණය සහ එහි අරමුදල් භාරව සිටීම;

(ඊ) සංස්ථාවේ අරමුණු නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා කමිටු පිහිටුවීම ; සහ

(උ) සංස්ථාවේ සහ මණ්ඩලයේ සාමාජිකයන්ගේ සුදුසුකම් සහ නුසුදුසුකම්.

(2) සංස්ථාව විසින් සාදනු ලබන යම් රීතියක්, (1) වන උප වගන්තිය යටතේ එවැනිම රැස්වීමක දී එවැනිම ආකාරයට සාදන ලද රීතියක් ලෙස සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සෑම කල්හිම සංස්ථාවේ තත්කාලයේ බලපවත්වන රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

7. (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු අතර, ත්‍යාග, තෙස්තමේන්තු නියාදන, පැවරුම්, පරිත්‍යාග, සම්මාදම් මුදල්, දායක මුදල්, ගාස්තු, ප්‍රදාන හෝ මූල්‍ය ආයෝජන වශයෙන් මේ දක්වා ලැබූ හෝ මින්මතු සංස්ථාවට ලැබෙන හෝ සියලු මුදල්, මණ්ඩලය විසින් තීරණය කරනු ලබන බැංකු එකක හෝ වැඩි ගණනක, සංස්ථාවේ අරමුදලේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ බලතල සහ කාර්ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සඳහා සංස්ථාව විසින් දරනු ලැබූ සියලු වියදම් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

විගණනය හා ගිණුම්.

8. (1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) සංස්ථාව විසින් එහි ආදායම සහ වියදම, වත්කම් සහ බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) සංස්ථාවේ ගිණුම්, මණ්ඩලය විසින් පත් කරනු ලබන සුදුසුකම් ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ "සුදුසුකම් ලත් විගණකවරයා" යන්නෙන්—

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා ඒ ආයතනය විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක්; හෝ

(ආ) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියේ යෙදීම සඳහා ඒ ආයතනය විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද සාමාජිකයන්ගෙන් යුත් එවැනි ගණකාධිකාරී සමාගමක් අදහස් වේ.

සංස්ථාවේ මුද්‍රාව.

**9.** සංස්ථාවේ මුද්‍රාව, ලේකම්වරයාගේ භාරයේ තිබිය යුතු අතර, සභාපතිවරයා සහ මණ්ඩලය විසින් යථා පරිදි බලය දෙන ලද වෙනත් සාමාජිකයකු ඉදිරිපිට දී හැර කිසිම සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු අතර, ඔවුන් පැමිණ සිටින බවට සලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි ඔවුන් විසින් තම නම අත්සන් කළ යුතු අතර, ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට පරිබාහිරව විය යුතු ය.

පදනම විසින් ගෙවිය යුතු සහ පදනමට අයවිය යුතු ණය මුදල්.

**10.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පදනම විසින් ගෙවිය යුතු සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවනු ලැබිය යුතු අතර, එදිනට පදනමට අයවිය යුතු සියලු ණය, පදනමට ගෙවිය යුතු සම්මාදම් මුදල් සහ දායක මුදල්, මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව වෙත ගෙවනු ලැබිය යුතු ය.

සාමාජිකයන්ගේ වගකීම් සීමා කිරීම.

**11.** සංස්ථාවේ කිසිදු සාමාජිකයකු, සංස්ථාවේ ණය සහ බැරකම් නිදහස් කිරීමේ කාර්යය සඳහා හෝ වෙනත් යම් කාර්යයක් සඳහා ඒ සාමාජිකයාගෙන් සංස්ථාවට අයවිය යුතු සාමාජික මුදල් ප්‍රමාණය ඉක්මවන යම් දායක මුදලක් ගෙවීමට යටත් නොවිය යුතු ය.

මුදල් සහ දේපළ අදාළ කර ගැනීම.

**12.** කවර ආකාරයෙන් හෝ ලබා ගන්නා සංස්ථාවේ මුදල් හා දේපල මෙහි දක්වා ඇති සංස්ථාවේ පරමාර්ථ ඉටුකර ගැනීම කෙරෙහි පමණක් අදාළ කරගත යුතු අතර එහි යම් කොටසක් සංස්ථාවේ සාමාජිකයන් වෙත ඍජුවම හෝ වක්‍රව ලාභාංශ, ප්‍රසාද දීමනා, ලාභ හෝ වෙනත් දෙයක් වශයෙන් ගෙවීම හෝ පැවරීම නොකළ යුතු ය.

සංස්ථාව විසින් චංචල සහ නිශ්චල දේපළ දැරිය හැකි බව.

**13.** යම් මිළට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නියාදනයක් හෝ වෙනත් යම් ආකාරයකින් හෝ සංස්ථාව සතුවන චංචල හෝ නිශ්චල යම් දේපළක් අත්කර ගැනීමට සහ දැරීමට මේ පනතේ විධිවිධාන වලට යටත්ව නීතියෙන් සංස්ථාවට හැකියාව සහ බලය ඇති අතර, ඒ දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ වෙනත් ආකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය ඇතිව, 6 වන වගන්තිය යටතේ සාදන ලද සංස්ථාවේ රීති වලට යටත්ව, සංස්ථාවේ කාර්ය සඳහා සංස්ථාව විසින් ඒ සියලු දේපළ දැරිය යුතු ය.

විසුරුවා හැරීමේ දී ඉතිරි වන දේපළ.

**14.** සංස්ථාව විසුරුවා හැරීමේ දී එහි සියලු ණය හා බැරකම් පියවීමෙන් පසු යම් දේපළක් ඉතිරිවී තිබුණහොත්, ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර, බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ ලාභයක් ස්වකීය සාමාජිකයන් අතර බෙදීම තහනම් කරනු ලබන්නා වූ ද, වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. සංස්ථාව විසුරුවා හරිනු ලබන අවස්ථාවේ දී හෝ ඊට පෙරාතුවම සංස්ථාවේ සාමාජිකයන් විසින් එම ආයතනය හෝ ආයතන තීරණය කරනු ලැබිය යුතු ය.

15. ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය. ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

16. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවයක් ඇතිවුවහොත් සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.